<u>පටුන</u>


| | පිටු අංක |
|---|---|
| හැඳින්වීම | 1 |
| පෙරදිග සංගීත විෂයයේ පොදු නිපුණතා | 2 |
| ශ්‍රේණියට අදාළ විෂයයේ නිපුණතා | 3 |
| නිපුණතා හා නිපුණතා මට්ටම් | 4 |
| විෂය නිර්දේශය | 8 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායයන් හා කාලඡේද | 12 |
| ගුණාත්මක යෙදවුම් | 13 |
| පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් | 14 |
| තක්සේරුකරණය හා ඇගයීම් නිර්ණායක | 15 |


Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# හැඳින්වීම

2007 වර්ෂයේ 10 ශ්‍රේණිය සිට ක්‍රියාත්මක වන මෙම නිපුණතා පාදක නව විෂය නිර්දේශයට අනුව 2008 වර්ෂයේදී අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය සඳහා සිසුන්ට මුල්වරට පෙනී සිටීමට සිදුවේ. මේ අනුව 6 ශ්‍රේණියේ සිට ප්‍රගුණ කළ ගායනය, වාදනය යන විෂය ක්ෂේත්‍ර වලින් තමා වැඩි දක්ෂතාවය දක්වන අංශය තම අභිමතය පරිදි සහ ගුරු භවතුන්ගේ මඟපෙන්වීමෙන් තෝරාගෙන ප්‍රායෝගික පරීක්ෂණයට පෙනී සිටීමට හැකියාව ඇත.

මෙතෙක් ක්‍රියාත්මක වූ අරමුණු පාදක විෂය නිර්දේශ වෙනුවට නිපුණතා පාදක නව විෂය නිර්දේශයක් මෙවර හඳුන්වාදීමෙන් ගුරුවරයාගේ සම්ප්‍රේෂණ භූමිකාව පරිණාමන භූමිකාවකට පරිවර්තනය වේ.

මෙහිදී නව විෂය නිර්දේශය මඟින් ගුරුවරයාගේ මඟපෙන්වීම යටතේ ශිෂ්‍යයා විෂය කරුණු ගවේෂණයට යොමු කොට ක්‍රියාකාරකම් මඟින් ලබන ඉගෙනුම ජීවිත පුරුද්දක් බවට පත්වනු ඇත. එය නිපුණතාවක් ලෙස හැඳින්වේ.

රසාස්වාදය, නිර්මාණාත්මක ක්‍රියාකාරකම්, ප්‍රායෝගික, සිද්ධාන්ත හා සංස්කෘතික පසුබිම වශයෙන් විෂය ක්ෂේත්‍ර 5 ක් මීට පෙර ක්‍රියාත්මක වූ විෂය නිර්දේශයෙහි වෙන් වෙන්ව දක්වා තිබුණද ඒවා මින් ඉදිරියට නිපුණතා පාදක ක්‍රියාකාරකම් ලෙස ප්‍රායෝගික ස්වරූපයෙන් සමෝධානිත ව ඉගෙනුමට යොමු කිරීම මෙම නව නිර්දේශය මඟින් සිදුවේ.

දැනුම, කුසලතා වලින් යුතු පුද්ගලයන් පමණක් නොව, මානව හිතවාදී, නිර්මාණාත්මක චින්තනයෙන් හෙබි, සංවේදී රසිකත්වයක් ඇති පුරවැසියකු බිහි කිරීම ද පාසල් විෂය මාලාවෙන් ඉටුවිය යුතු ය. ඒ සඳහා දායක වන සෞන්දර්ය විෂයයට වැදගත් ස්ථානයක් හිමි වේ.

සෞන්දර්ය අධ්‍යාපනය යටතේ සංගීතය විෂය ඉගෙනුමෙන් ශිෂ්‍යයාට පාසල් ජීවිතය තුළ පමණක් නොව පසුකාලීනව ද තම ජීවිත පැවැත්ම සඳහා අවශ්‍ය වන සංවේදී අධ්‍යාත්මයක් හා නිපුණතා වර්ධනය කර ගැනීමට හැකිවනු ඇත. මෙහිදී පෙරදිග සංගීතය විෂයයක් ලෙස හැදෑරීමෙන් ශිෂ්‍යයා තුළ වර්ධනය විය යුතු ප්‍රධාන නිපුණතා 8 ක් හඳුන්වා දී ඇත. එම නිපුණතාවන්ට අනුව එක් එක් ශ්‍රේණියේදී ලඟාවිය යුතු යැයි අපේක්ෂිත නිපුණතා මට්ටම් පෙළ ගස්වා ඇත.

නිර්දේශිත විෂය කරුණු ගායනය මූලික කොට ගොඩනඟා ඇති වුවද කිසියම් ශිෂ්‍යයකු වාදනය මූලික කොටගෙන මෙම විෂයයන් හදාරන්නට අපේක්ෂා කරන්නේ නම් නිර්දේශිත ස්වර වාද්‍ය භාණ්ඩයක් මඟින් සියළුම කොටස් ප්‍රායෝගික ව අධ්‍යයනය කළ හැක.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

# <u>පෙරදිග සංගීතය විෂයයේ පොදු නිපුණතා.</u>

1. සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.
2. වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.
3. සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්වයන් ලඟා කරගැනීමට හුරුවෙයි.
4. දේශීය ජනසංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.
5. ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.
6. සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදාබැලීම් කරයි.
7. සංකේතානුසාරයෙන් සංගීතය ලියා දක්වන විධි හඳුනා ගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.
8. සංගීතයේ තාක්ෂණික මෙවලම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## පෙරදිග සංගීතය

## නිපුණතා හා නිපුණතා මට්ටම්

1.0 සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.

- 1.0 ගායනයේ මූලික හැකියා වර්ධනය කරගනියි.
- 1.1 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත්ව ස්වර සප්තකය ගායනය කරයි.
- 1.2 තාලය සහ ලය පිළිබඳ හැකියා ප්‍රදර්ශනය කරයි.
- 1.3 ශුද්ධ සහ කෝමල ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් රාගධාරී සංගීතය ප්‍රායෝගික අධ්‍යයනයට එළඹෙයි.
- 1.4 සමමත් කැටි සහිත තාල පද අධ්‍යයනය කරයි.
- 1.5 ආරෝහණ හා අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.
- 1.6 මිශ්‍ර මත්කැටි සහිත තාලපද අධ්‍යයනය කරයි.
- 1.7 රාගභාවය සහ එකිනෙක වෙනස්කම් ඇතිවීමට බලපාන හේතු විමර්ශනය කරයි.
- 1.8 ආරෝහණ අවරෝහණයේ විකෘති ස්වර ඇතුලත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.
- 1.9 හින්දුස්ථානි රාගධාරී සංගීතයට අදාළ තාලපද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවෙන් නිකුත් වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි.
- 1.10 හින්දුස්ථානි රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ වාදන හා ගායන හැකියා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.
- 1.11 රාගධාරී සංගීතයට අදාළව අධ්‍යයනය කළ තාල හැකියා ප්‍රදර්ශනය කරයි.

2.0 වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

- 2.0 වාදනයේ මූලික හැකියා වර්ධනය කරගනියි.
- 2.1 ස්වර වාද්‍ය භාණ්ඩ හඳුනාගනිමින් වාදනයට හුරුවෙයි.
- 2.2 ස්වර වාද්‍ය භාණ්ඩ මගින් ගීත වාදනය කරයි.
- 2.3 විවිධ ස්වරස්ථාන ශ්‍රැති කර ගනිමින් ගීත හා සංගීත භාණ්ඩ වාදනය කරයි.
- 2.4 ස්වර ලිපි බලා වාදනය කරයි
- 2.5 වාදන දක්ෂතා ප්‍රසංගාත්මකව ප්‍රදර්ශනය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

3.0 සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්ත්වයන් ලඟා කරගැනීමට හුරුවෙයි.

3.0 ගීත රසාස්වාදයේ යෙදෙයි.

3.1 ගී අනුවාදන ශ්‍රවණය කරයි.

3.2 අද්‍යතන සරල ගීත රසාස්වාදයේ යෙදෙයි.

3.3 සම්භාව්‍ය සංගීත රසාස්වාදයට හුරුවෙයි.

3.4 ගීතයේ මුඛ්‍ය ලක්ෂණ හා ප්‍රබලතාවය සාකච්ඡා කරමින් රසවිඳියි.

3.5 ජන සංගීතය ඇසුරින් නිර්මාණය වූ ගීත විමසයි.

3.6 සම්භාව්‍ය ගායන ශෛලීන් අගය කරයි.

3.7 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනාගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ යෙදෙයි.

3.8 දේශීය සංගීතයේ උන්නතියට දායක වූ මෙරට මුල් යුගයේ සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රසවිඳියි.

3.9 උතුරු ඉන්දීය අද්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හඳුනාගනිමින් ඔවුන්ගේ නිර්මාණ අගය කරයි.

3.10 රාගධාරී සංගීතය ආශ්‍රයෙන් නිර්මාණය වී ඇති ගායන වාදන පිළිබඳ සාකච්ඡා කරමින් ප්‍රායෝගිකව රසාස්වාදයේ යෙදෙයි.

3.11 බටහිර සම්භාව්‍ය සංගීතයේ සංධ්වනිවල ස්වභාවය විමසමින් රසාස්වාදයේ යෙදෙයි.

4.0 දේශීය ජනසංගීතාංග පිළිබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.

4.1 දේශීය ජන ක්‍රීඩා ආශ්‍රිත ගීත ගායනය කරයි.

4.2 ගැමි ගී පිළිබඳ සංස්කෘතිකමය පසුබිම විමසමින් ගායනය කරයි.

4.3 මහනුවර යුගය හා සම්බන්ධ ගී පිළිබඳ විචාරාත්මක අදහස් දක්වමින් ගායනය කරයි.

4.4 කෙත හා බැඳි ගැමි ගී පිළිබඳ විමසමින් ගායනය කරයි.

4.5 දේශීය අවනද්ධ වාද්‍ය භාණ්ඩවල සුවිශේෂතා සාකච්ඡා කරමින් අගය කරයි.

4.6 සිංහල පද්‍ය ගායනාවන්හි ස්වභාවය හඳුනා ගනිමින් ගායනය කරයි.

4.7 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගික ව අධ්‍යයනය කරයි.

4.8 සබරගමු සහ පහතරට සම්ප්‍රදායන්ට අයත් වන්නම්වල ස්වභාවය විමසමින් ගායනය කරයි , අගය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

5.0 ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැඳි සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.

5.0 ව්‍යවහාරික සංගීතයේ ප්‍රචලිත ළමා ගීත ගායනය කරයි.
5.1 නාට්‍ය ගීත ගයමින් අගය කරයි.
5.2 ගැමි නාටක ගී ගයමින් අගය කරයි
5.3 ශ්‍රී ලංකාවේ පැවති ප්‍රබල රංග සම්ප්‍රදායන් හඳුනාගනිමින් අගය කරයි.
5.4 නවනාට්‍ය සම්ප්‍රදාය සහ සංගීතයේ ස්වභාවය විමසමින් ගායනා කරයි.
5.5 ජනප්‍රිය සංගීතයේ බහුලව භාවිතා වන සංගීත භාණ්ඩ පිළිබඳ විමසයි.
5.6 විවිධ ශෛලීන් ආභාසය කරගත් නවනාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කරගනිමින් ගායනයේ යෙදෙයි.
5.7 නාඩගම් සහ නූර්ති සංගීතයේ ඇති ප්‍රායෝගික වෙනස්කම් සංසන්දනාත්මකව දක්වයි.
5.8 ශ්‍රී ලංකාවේ චිත්‍රපට ගීතවල නිර්මාණාත්මක අගය තර්කානුකූලව විමසමින් තෝරාගත් ගීත ගායනය කරයි.

6.0 සංගීත නිර්මාණ කාර්යයේ අත්හදා බැලීම් කරයි.

6.0 හඬ නිපදවිය හැකි මෙවලම් සකසයි.
6.1 විවිධ රිද්ම රටා නිර්මාණය කරයි.
6.2 ආදේශ භාණ්ඩ ආශ්‍රිත නිර්මාණයේ යෙදෙයි.
6.3 සංගීත නිර්මාණයේදී ගීතයක පද මාලාවේ වැදගත්කම විස්තර කරයි.
6.4 ගීතනු නිර්මාණයේ අත්හදා බැලීම් කරයි.
6.5 කටහඬෙහි විවිධ හඬතල භාවිත වන අයුරින් තනු නිර්මාණය කරයි.
6.6 ගීපද රචනාවක සුවිශේෂ ලක්ෂණ හඳුනාගනිමින් ගීපද නිර්මාණය කර තනු නිර්මාණය කරයි.
6.7 නාදයේ විද්‍යාත්මක පදනම භාවිතා කරමින් සරල සංගීත භාණ්ඩයක් නිර්මාණය කරයි.
6.8 ව්‍යවහාරික සංගීතයේ ස්වභාවය හඳුනාගනිමින් ඒ හා සම්බන්ධ සරල නිර්මාණ කරයි.
6.9 සරල ගීතයක අන්තර්ගතය විමසමින් පෙර හා අතුරු සංගීත ඛණ්ඩ නිර්මාණය කරයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

7.0 සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුනාගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරු කිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.

7.0 ප්‍රස්තාරකරණයේ මූලික කුසලතා ලබයි.

7.1 පෙරදිග ප්‍රස්තාරකරණයේ සුවිශේෂතා දක්වයි.

7.2 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

7.3 බටහිර සංගීත ප්‍රස්තාරකරණයේ මූලිකාංග විමසයි.

7.4 බටහිර සංගීත සංකල්ප හඳුනාගනිමින් භාවිත කරයි.

7.5 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.

7.6 පෙරදිග සහ අපරදිග ක්‍රම ශිල්ප මත ස්වර ප්‍රස්තාර කරමින් සංගීතය සෘති සංක්‍රමණය කරගැනීමේ හුරුව ලබයි.

7.7 විවිධ ස්වර ශ්‍රැති කර ගනිමින් ප්‍රස්තාර කරණයේ යෙදෙයි.

8.0 සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ එහි භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර, ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.

8.1 සංගීත ප්‍රසංගයක අත්‍යාවශ්‍ය තාක්ෂණික මෙවළම් හසුරුවන ආකාරය පිළිබඳ අධ්‍යයනය කරයි.

8.2 නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයි.

8.3 සංගීත අධ්‍යයනයේ, නිර්මාණයේ සහ සංරක්ෂණයේදී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම්වල යෙදෙයි.

8.4 සංගීතය පටිගත කිරීමේ ක්‍රම ශිල්ප හඳුනාගනිමින් සංසන්දනාත්මක විචාරයක යෙදෙයි.

8.5 පරිගණකය උපයෝගි කරගනිමින් විශ්ව සංගීත ක්ෂේත්‍ර ඇසුරුකිරීමේ හුරුව ලබයි.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## පෙරදිග සංගීතය - 10 ශ්‍රේණිය.

| | නිපුණතා සහ නිපුණතා මට්ටම් | විෂය අන්තර්ගතය. | කාල ඡේද |
|---|---|---|---|
| 1.0 | සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනාගනිමින් ප්‍රායෝගික හැකියා ප්‍රදර්ශනය කරයි.<br><br>1.9 ආරෝහණයේ සහ අවරෝහණයේ විකෘති ස්වර ඇතුළත් රාග හඳුනාගනිමින් ගායන හැකියා වර්ධනය කරගනී.<br><br>1.10 හින්දුස්ථානි තාල පද හා සම්බන්ධ අවනද්ධාක්ෂර තබ්ලාවේ නිකුත්වන අයුරු විමර්ශනය කරමින් ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | ▪ භෛරවි සහ බමාජ් රාග විස්තර<br>▪ එම රාගවල ස්වර අභ්‍යාස<br>▪ එම රාගවල සර්ගම්<br>▪ එම රාගවල මධ්‍යලය ගීත<br>▪ භෛරවි සහ බමාජ් රාගවලට අයතරි රාගාංග ඇතුළත් කෙටි ස්වර ඛණ්ඩ ගායනය<br><br>▪ හින්දුස්ථානි තාලපද වල අවනද්ධාක්ෂර ගොඩනැගෙන අයුරු හා ඒවා තබ්ලාවෙන් වයන ස්වභාවය | 16<br><br>06 |
| 2.0 | වාද්‍ය භාණ්ඩයන්හි ස්වරූපය වටහා ගනිමින් වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.<br><br>2.5 ස්වර ලිපි බලා වාදනය කරයි. | ▪ ස්වර ලිපි කියවීමේ ක්‍රමශිල්ප.<br>▪ ව්‍යවහාරික සංගීතයේ දී තනුවක් ස්වර ලිපි කිරීමේ ක්‍රම ශිල්ප.<br>▪ ස්වර පුවරුවෙන් ස්වර ලිපි බලා වාදනය.<br>▪ තෝරා ගත් භාණ්ඩයෙන් ස්වර ලිපි වාදනය. | 07 |
| 3.0 | සංගීත රසාස්වාදයෙන් ජීවිතයේ වින්දනීය අවස්ථා හා බැඳි මානසික තත්වයන් ළඟා කරගැනීමට හුරුවෙයි.<br><br>3.8 ව්‍යවහාරික සංගීතයේ වර්ධනයේ විවිධ අවස්ථා හඳුනාගනිමින් එක් එක් යුගවලට අයත් ගීත ගායනයේ රසාස්වාදයේ යෙදෙයි.<br><br>3.9 දේශීය සංගීතයේ උන්නතියට දායක වූ මෙරට මුල් යුගයේ සංගීතඥයින් අගය කරමින් ඔවුන්ගේ නිර්මාණ රසවිඳියි.<br><br>3.10 උතුරු ඉන්දීය අද්‍යතන ශාස්ත්‍රීය සංගීතඥයින් හා නිර්මාණකරුවන් හඳුනා ගනිමින් ඔවුන්ගේ නිර්මාණ හා කෘති අගය කරයි. | ▪ ග්‍රැමෆෝන් තැටියුගයේ තොරතුරු සහ ගීත ගායනය ( හින්දි තනු යුගයෙන් , මුල්යුගයෙන් සහ ස්වාධීන තනු යුගයෙන් ගීතයක් බැගින් )<br>▪ මුල් යුගයේ ගුවන් විදුලි සරල ගීත පිළිබඳ තොරතුරු ,ගීත ගායනය ( සුනිල් ශාන්ත , ආනන්ද සමරකෝන් )<br>▪ කපිරිඥ්ඥා පිළිබඳ තොරතුරු සහ ගීත ගායනා<br><br>▪ ආර්.මුත්තුසාමි ශූරීන්, මොහොමඩ් ගවුස් ශූරීන්, බී.එස්.පෙරේරා ශූරීන් ගේ නිර්මාණ<br><br>▪ පණ්ඩිත් හරිප්‍රසාද් චෞරෂියාගේ, උන්නාද් ශබීර් හුසේන්, ජග්ජිත් සිං සංගීත කෘති | 07<br><br>06<br><br>03 |
| 4.0 | දේශීය ජනසංගීතාංග පිළවීබඳ ප්‍රායෝගික හැකියා වර්ධනය කරගනිමින් සංස්කෘතික උරුමයන් රැකගනියි.<br><br>4.6 සිංහල පද්‍ය ගායනාළඩ | ▪ සේ ගී වල ස්වභාවය. | |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | | |
|---|---|---|---|
| | ස්වභාවය හඳුනාගනිමින් ගායනය කරයි.<br><br>4.7 ජන ගී වර්ග කරමින් එක් එක් වර්ගයට අයත් ගී පිළිබඳ ප්‍රායෝගිකව අධ්‍යයනය කරයි. | ▪ ගුත්තිලය සහ සැළලිහිණි සන්දේශයේ කාව්‍ය ගායනා ( ගුත්තිලයේ විවිධ විරිත් , සහ සමුද්‍රඝෝෂ වෘත්තය )<br>▪ සම්ප්‍රදායික පද්‍ය ගායනාවන් හි නාදමාලා.<br><br>▪ ජන ගී වර්ගීකරණය හා විවිධ වර්ගයේ ජන ගී. (මෙහෙගී, බැතිගී, සමාජගී, සේගී,එක බැගින් ගායනය)<br><br>▪ ආඝාතාත්මක ජන ගී සහ ඒ හා බැඳි තොරතුරු<br><br>▪ අනාඝාතාතමක ජන ගී සහ ඒ හා බැඳි තොරතුරු | 06<br><br><br><br>08 |
| 5.0 | ව්‍යවහාරික සංගීතය සහ රංගකලා හා බැව්ධීවී සංගීතාංග පිළිබඳ අත්දැකීම් ලබයි.<br><br>5.8 විවිධ ශෛලින් ආභාසය කරගත් නව නාට්‍ය සම්ප්‍රදායන් අවබෝධ කරගනිමින් ගායනයේ යෙදෙයි.<br><br>5.9 උතුරු ඉන්දීය චිත්‍රපට සංගීත නිර්මාණයේ රාගධාරී පසුබිම සාකච්ඡා කරමින් රසවිඳිමින් ගීත ගායනයේ යෙදෙයි. | ▪ නව නාට්‍ය සඳහා නාඩගම් ශෛලියේ ආභා)ය (මනමේල සිංහබාහු කාලගෝල නාට්‍ය ඇසුරින් )<br><br>▪ බව්පිබව්රා, මධුමතී, කොහිනූර්, පාකීෂා, ගීත්, අභිමාන්, දේව්දාස්, ජනක් ජනක් පායල් හාජේ, අම්රපාලී. චිත්‍රපටයක් ඇසුරින් තෝරාගත් ගීතයක් හෝ දෙකක් ගායනය, තනුව රිද්මය, සංගීත ඛණ්ඩ හා නිර්මාණාත්මක අගය . | 04<br><br>04 |
| 6ග0 | සංගීත නිර්මාණ කාර්යයයේ අත්හදාබැලීම් කරයි.<br><br>6.7 ගීපද රචනාවක සුවිශේෂ ලක්‍ෂණ හඳුනා ගනිමින් ගීපද නිර්මාණය කර තනු නිර්මාණය කරයි.<br><br>6.8 නාදයේ විද්‍යාත්මක පදනම භාවිත කරමින් සරල සංගීත භාණ්ඩයක් නිර්මාණය කරයි. | ▪ පදරචනාළවීරි ගීතයකට සුදුසු වන ආකාරය<br>▪ මාතෘකාවක් මත ධි පද නිර්මාණය.<br>▪ සුදුසු තනු නිර්මාණය.<br>▪ කවියක් ගීතයක් වන අයුරු.<br>▪ ගීතවත් දෙබස්<br><br>▪ සයිලපෝනය , ග්ලොකන්ස්පිලරි, සහ ජලතරංග භාණ්ඩවල ස්වභාවය<br>▪ ලී කැබලි , ලෝහ කැබලි හෝ නල ආශ්‍රයෙන් සංගීත භාණ්ඩයක් නිර්මාණය . | 04<br><br>06 |
| 7.0 | සංකේතානුසාරයෙන් සංගීතය ලියාදක්වන විධි හඳුවීගනිමින් විශ්ව සංගීත කෘති ඇසුරුකිරීමටත්, දේශීය සංගීතාංග ලෝකය වෙත යොමු කිරීමටත් අත්‍යාවශ්‍ය මූලික නිපුණතා වර්ධනය කරගනියි.<br><br>7.6 ශ්‍රවණ මාධ්‍යයෙන් ගී පද ප්‍රස්තාර කරයි.<br><br>7.7 පෙරදිග සහ අපරදිග ක්‍රමශිල්ප මත ස්වර ප්‍රස්තාරකරමින් සංගීතය හුවමාරුකරගැනීමේ හුරුව ලබයි. | ▪ බිප්තාල් දීප්චන්දි යන තාල මත නිර්මාණය වූ ගීත ප්‍රස්තාර කිරීම.<br>▪ විෂමග්‍රහල අවග්‍රහ සහිත ගීපද ප්‍රස්තාර කරණය<br><br>▪ පෙරදිග ප්‍රස්තාර අපරදිග ක්‍රමයට පරිවර්තනය<br>▪ අපරදිග ප්‍රස්තාර පෙරදිග ක්‍රමයට පරිවර්තනය | 05<br><br>05 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

| | | | |
|---|---|---|---|
| 8.0 | සංගීතයේ තාක්ෂණික මෙවළම් සහ භෞතික විද්‍යාත්මක පදනම අධ්‍යයනය කර ප්‍රසංගාත්මක හැකියා වඩාත් සාර්ථක ලෙස ඉදිරිපත් කරයි.<br><br>8.2 නාදයේ ත්‍රිවිධ ගුණ සහ එහි භෞතික පදනම විග්‍රහ කරයිග<br><br>8.3. නාද සුසංයෝග බවෙහි භෞතික පදනම විග්‍රහ කරයි.<br><br>8.4. සංගීත අධ්‍යයනයේ , නිර්මාණයේ, සහ සංරක්ෂණයේදී පරිගණකය භාවිතය පිළිබඳ අවබෝධය ලබමින් ප්‍රායෝගික අත්හදා බැලීම් වල යෙදෙයි. | ▪ තාරතාවය , විපුලතාවය, ධ්වනිගුණය.<br>▪ නාද නිෂ්පත්තිය සහ ප්‍රගමනය<br>▪ සප්තකයේ ස්වර සංඛ්‍යාත.<br><br>▪ Harmony සිද්ධාන්තයේ විද්‍යාත්මක පදනම<br><br>▪ Playing & Recording Music with Computer<br>▪ E-Learning , E-Music(MIDI)<br>▪ E-Encyclopidia & Music | 04<br><br>06 |

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායන් හා කාලච්ඡේද</u>

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපායන් හා ඉගෙනුම් ඉගැන්වීම ක්‍රියාවලියේදී මූලික ව සිසුන් ගවේෂණයට යොමු කිරීම අපේක්ෂා කෙරේ. හුදෙකලාව දැනුම ගවේශණයට වඩා යුගල හෝ කුඩා කණ්ඩායම් වශයෙන් මෙම කාර්යයේ සිසුන් යෙදවීම අර්ථවත් වේ. මේ අනුව සමාජ හැකියා වර්ධනය කිරීමට මෙම ක්‍රමය දායක වේ.

මේ අනුව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදයට ක්‍රම ශිල්ප රාශියක් ඇතුළත් කළ හැකි වේ.

ප්‍රවේශය සඳහා

- බුද්ධි කලම්බනය
- සංවාද
- භූමිකා රංගන
- පටිගත කළ ගීත ඇසුරෙන් ප්‍රවේශවීම.
- පින්තූර ඇසුරෙන්

ගවේෂණය සඳහා

- කණ්ඩායම් සාකච්ඡා
- නිර්මාණ ක්‍රියාකාරකම්
- තොරතුරු අධ්‍යයනය
- ප්‍රායෝගිත ක්‍රියාකාරකම්
- ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක ආශ්‍රිත ක්‍රියාකාරකම්
- ක්ෂේත්‍ර චාරිකා
- ගායන වාදන ප්‍රසංග
- නාට්‍ය නිර්මාණ නැරඹීම.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

<u>ගුණාත්මක යෙදවුම්</u>

<u>10 ශ්‍රේණිය</u>

01. සංගීත භාණ්ඩ
    තබ්ලාව, මද්දලය,සර්පිනාව, වයලීනය, රබාන, තාලම්පට, ඉංග්‍රීසි මැන්ඩලීනය
02. ප්‍රචලිත ගායක/ගායිකාවන්ගේ ගීත ප්‍රස්ථාර කිහිපයක්
03. නිර්දේශිත ගීත ඇතුළත් ශ්‍රව්‍ය පට දෘශ්‍යපට (ග්‍රැමෆෝන් ගීත පැරණි චිත්‍රපට ගීත, කපිරිඤ්ඤා ගීත, සුනිල් ශාන්ත /ආනන්ද සමරකෝන් ගීත මනමේ , සිංහබාහු, කාලගෝල නාට්‍යයේ ගීත, රාගධාරී පසුබිම ඇති හිංදි චිත්‍රපට ගීත)
04. භාරතීය ගායන හා වාද්‍ය ශිල්පීන්ගේ කෘති (පණ්ඩිත් හරිප්‍රසාද් චෞරෂියාගේ බටනලා වාදන, ශබීර් හුසේන් සංගීතඥයාගේ තබ්ලා වාදන, ජග්ජිත්සිං සංගීතඥයාගේ ගසල් ගීත ඇතුළත් ශ්‍රව්‍යපට/දෘශ්‍යපට
05. ගුත්තිලය
06. සැළලිහිණි සංදේශය
07. අඟල් 10, 08, 06 ආදි දිගින් යුත් ලෝහ කැබලි හෝ ඇලුමිනියම් පටි කැබලි කිහිපයක්
08. යකඩ නල හෝ ඇලුමිනියම් නල වලින් අඟල් 10,15, 20 ආදි වශයෙන් කපාගත් කොටස්
09. අඟල් 10, 08, 06 වශයෙන් දිග, අඟල් 2 පළල බුරුත, හල්මිල්ල වැනි තද ගතියෙන් යුත් ලී කැබලි කිහිපයක්
10. අපරදිග ස්වර ප්‍රස්ථාර කිහිපයක්
11. සංගීතයේ ස්වර සංඛ්‍යාත දැක්වූ දෘශ්‍ය උපකරණයක්
12 MIDI සහිත විද්‍යුත් ස්වර පුවරුවක්
13. කැසට් රේකෝඩරයක්
14. පරිගණකයක්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## පාසලේ ප්‍රතිපත්ති සහ වැඩසටහන්

ළමයාගේ විචාර ශක්තිය වර්ධනය කිරීම සඳහා ගණිතය, විද්‍යාව ආදි විෂයයන් අවශ්‍ය වන්නාසේම ඔවුන්ගේ වින්දන හා නිර්මාණාත්මක හැකියා වර්ධනය කිරීම සඳහා සෞන්දර්ය විෂයයන් ඉගැන්වීම අත්‍යාවශ්‍ය වේ. නිපුණතා පාදක ක්‍රියාකාරකම් පංති කාමරය තුළ ක්‍රියාත්මක කිරීමෙන් ශිෂ්‍යයාගේ සංගීත විෂයය හා බැඳි ප්‍රායෝගික කුසලතා වර්ධනය කිරීම මෙන්ම යහපත් ආකල්ප වර්ධනයෙන් සුසමාහිත පෞරුෂයකින් ගොඩනැගෙනු ඇත.

මෙම කාර්යයෙහිලා .

1. ළමා ගීත ගායන වාදන තරඟ
2. ළමා නාට්‍ය තරඟ
3. ගායන, වාදන ප්‍රදර්ශන
4. සෞන්දර්ය කලා සංගම් පිහිටුවීම.
5. පන්ති මට්ටමේ කෙටි විවිධ ප්‍රසංග
6. වාර්ෂික විවිධ ප්‍රසංග
7. නව නිර්මාණාත්මක ක්‍රියාකාරකම් මගින් ආදේශ භාණ්ඩ නිර්මාණ.
8. බැති ගී ප්‍රසංග
9. පරිගණක තාක්ෂණය ඇසුරෙන් නිර්මාණ.
10. උදෑසන රැස්වීම ආශ්‍රිතව කරනු ලබන ගායන වාදන ක්‍රියාකාරකම්
11. පාසල අවට ප්‍රදේශයේ පැවැත්වෙන විශේෂ සංගීත උත්සව හා ශාන්තිකර්ම
12. රාජ්‍ය උත්සව හා බැඳි ගායන වාදන අංග
13. පාසල් තූර්ය වාදන කණ්ඩායම්

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved

## තක්සේරුකරණය හා ඇගයීම

10 වන ශ්‍රේණියේදී පෙරදිග සංගීතය විෂය තක්සේරුකරණය හා ඇගයීම සිදුවන්නේ පංතිකාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාකාරකම් සිදුවන අවස්ථාව තුළදීමය. අදාළ ක්‍රියාකාරකමට සුදුසු නිර්ණායක මත සිසුන් ඇගයීමට ලක් කළ යුතු ය. සිසුන්ගේ දක්ෂතා හඳුනාගෙන ඒවාට අවශ්‍ය උපස්ථම්භන ලබාදීමත් සුදුසු ප්‍රතිපෝෂණ ලබාදීමත් සිදුවිය යුතුය.

සිසුන්ට ඉදිරිපත් කරනු ලබන සෑම ක්‍රියාකාරකමකදී ම තක්සේරුකරණය හා ඇගයීම සිදුකිරීමට අවස්ථා තිබේ. සිසුන් කණ්ඩායම් වශයෙන් ගවේෂණයේ යෙදෙන අවස්ථාව තක්සේරුකරණයටත් කණ්ඩායම් අනාවරණ ඉදිරිපත් කෙරෙන හා අදහස් විස්තාරණය කෙරෙන අවස්ථා ඇගයීමටත් යොදා ගත හැකි වේ.

සිසුන්ගේ කාර්යයේ යෙදෙන අවස්ථාවලදී ඔවුන් සමීපව නිරීක්ෂණය කරමින් ඔවුන්ගේ හැකියා, නොහැකියා, ශක්තීන් හා දුර්වලතා හඳුනාගනිමින් පන්තියේ සෑම ශිෂ්‍යයෙකුම අවම ප්‍රවණතා මට්ටමට ගෙන ඒමට ගුරුවරය කටයුතු කළ යුතු වේ. මේ ක්‍රියාවලිය තක්සේරුකරණය නම් වේ. එසේම සිසුන් ස්වකීය අනාවරණ ඉදිරිපත් කරන හා අදහස් විස්තාරණය කරන අවස්ථාවලදී ඔවුන් ලඟාකරගත් ප්‍රවීණතා මට්ටම් විනිශ්චය කරමින් හා ප්‍රතිඵල සන්නිවේදනය කරමින් ඇගයීම් ක්‍රියාත්මක කළ හැකි වේ.

සිසු කණ්ඩායම් සමස්ත පන්තිය වෙත සාමූහිකව ඉදිරිපත් කරන අදහස්, ඇගයීම සඳහා යොදාගත හැකි පළමු අංශය බව මේ අනුව පැහැදිලි වේ. එම අදහස් නිවැරදි කිරීමට, වැඩි දියුණු කිරීමට හා විස්තාරණය කිරීමට කරණු ලබන ප්‍රයත්න ඇගයීම සඳහා පාදක වන දෙවන අංගය වේ.

සෑම ක්‍රියාකාරකමක් අවසානයේ දී ම හඳුන්වාදෙනු ලබන නිර්ණායක සහ තක්සේරුකරණයට හා ඇගයීමට යොදාගත හැකි වේ. මින් පළමු නිර්ණායක තුන දැනුම, ආකල්ප හා කුසලතා ඇගයීමට වෙන් වී ඇති අතර අනෙකුත් නිර්ණායක දෙක යහපත් ජීවන පුරුදු සිසුන් තුළ වර්ධනය කිරීමේ අරමුණින් හඳුන්වා දී තිබේ.

වර්ෂය තුළ නිම කළ යුතු පාසල් පාදක ඇගයීම් වාර ගණන හයකි. සිසුන් ඉගෙනුමෙහි යෙදෙන අතරතුර කෙරෙන ඇගයීමට අමතරව තෝරාගත් ලක්ෂණයන් හයකදී මෙම ඇගයීම් ක්‍රියාත්මක කිරීම වඩා ඵලදායි වේ. ඒ ඒ ලක්ෂ්‍යය සඳහා ගැළපෙන ඇගයීම් උපකරණ කල් තබා සකස් කර ගෙන තිබීම මෙහිදී වැදගත් වේ.

ප්‍රවීණතාව ලබාගැනීම මට්ටම් කිහිපයක් ඔස්සේ සිදුවන බැවින් විෂයයක ප්‍රවීණතාව තහවුරු කිරීමට අවම වශයෙන් ලකුණු 60 ක් ඉක්මවා ලකුණු ලබා ගැනීම අවශ්‍ය වේ

| | | | | | |
|---|---|---|---|---|---|
| ඒ අනුව ලකුණු | 0 | - | 60 | - | ප්‍රවීණතාව නැත |
| ලකුණු | 61 | - | 80 | - | ආසන්න ප්‍රවීණතාව |
| ලකුණු | 81 | - | 100 | - | ප්‍රවීණතාව |

සේ සැලකිය යුතුය.

Copyright © 2006 National Institute of Education - Sri Lanka. All rights reserved